FMM SRI LANKA
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
Free Media Movement

# මාධ්‍ය නිදහස: නිරීක්ෂණ වාර්තාව
# ஊடக சுதந்திரம்: கண்காணிப்பு அறிக்கை
# Media Freedom Rights Monitoring Report

MFRMD

2022 මාර්තු

2 වන වෙළුම - කලාප අංක 3


මිරිහානේදී මාධ්‍යවේදීන්ට ප්‍රහාර


අරුණ ප්‍රවෘත්ති කර්තෘට තර්ජන


මාස 16කට පසු කෝකිලදාසන්ට ඇප

**මාධ්‍ය නිදහසට අදාළව ඒ ඒ මාසය තුළ වාර්තා වන සිදුවීම්, පූර්ව සිදුවීම්වල වර්ධනයන් හා ඒවාට අදාළ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ. මාධ්‍යවේදීන්ගේ මෙන්ම ජනතාවගේ භාෂණයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සම්බන්ධ සිදුවීම්, නව නීති පැනවීම්, නීති ප්‍රතිසංස්කරණ සහ අදාළ ප්‍රස්තුතයන් පිළිබඳව ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පළ වන ප්‍රතිචාර යනාදිය කෙරෙහිද මෙහිදී අවධානය යොමු කෙරේ. මාධ්‍ය නිදහස පිළිබඳව නිරීක්ෂණය කිරීම සඳහා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය තෝරාගෙන ඇති විෂය පථයට/සංරචකයන්ට අදාළ සිදුවීම් 13ක් 2022 මාර්තු මාසයේදී නිරීක්ෂණය විය. මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව හා සුරක්ෂිතබවට අදාළ සිදුවීම් 3ක්, නීතිමය කොන්දේසි යන සංරචකය යටතට ගැනෙන සිදුවීම් 3ක්, මාධ්‍යයේ ස්වාධීනත්වයට අදාළ සිදුවීම් 2ක්, වෘත්තීයවේදීත්වයට අදාළ සිදුවීම් 2ක් සහ ව්‍යුහාත්මක කොන්දේසි යටතට ගැනෙන සිදුවීම් 3ක් ඒ අතර වෙයි.**

## නිරීක්ෂණය වූ සිදුවීම්

1. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී රන්ජන් රාමනායකගේ නිදහස උදෙසා සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරුන් ජිනීවා මානව හිමිකම් කොමිසම හමුවේ කරුණු දැක්වීම.
2. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වසරකුත් මාස 4ක කාලයක් රඳවා තබාගෙන සිටි මඩකලපුවේ මාධ්‍යවේදී කෝකිලදාසන් ඇප මත මුදාහැරීම.
3. වව්නියාව පුතුකුලම් ප්‍රදේශයේ හදිසි අනතුරක් වාර්තා කිරීමට ගිය මාධ්‍යවේදී රාසයියා ජයශංකර්ට පහර දී ඔහුගේ කැමරාවට අලාභහානි කිරීම.
4. ජනමාධ්‍ය නිදහසට තර්ජනයක් වන විධිවිධාන ඇතුළත් පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත පාර්ලිමේන්තුවේදී සම්මත වීම.
5. පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතෙන් තොරතුරු පනතට සහ භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහසට ඇති බලපෑම ගැන මහජන කතිකාවක් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සංවිධායකත්වයෙන් පැවැත්වීම.

6. ශ්‍රී ලංකාවේ ඉන්ටනෙට් පරිශීලකයන්ගේ සුරක්ෂිතබව හා ස්වයං නියාමනය ශක්තිමත් කිරීම අරමුණු කරගත් SafeWebLK වැඩසටහන කොළඹ දී ආරම්භ කිරීම.

7. 'ජනමාධ්‍යකරණය තුළ හිංසන පිටුදකිමු' යන්න තේමා කොටගත් සංවාදයක් 'මීඩියා සැලෝන්' වැඩසටහනේ සංවිධායකත්වයෙන් පැවැත්වීම

8. මාධ්‍යවේදී රාහුල් සමන්ත හෙට්ටිආරච්චිගේ වාර්තාකරණයක් සම්බන්ධයෙන් හිරු නාලිකාව හිමිකරුගේ සොහොයුරා වන දුමින්ද සිල්වා බලපෑම් කිරීම.

9. මානව හිමිකම් ආරක්ෂකයින්ගේ දැඩි විරෝධයට හේතු වූ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන සංශෝධන) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේදී සම්මත වීම.

10. ශ්‍රී ලංකා කර්තෘ සංසදය සහ ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය සංවිධානය කළ පුවත්පත් විශිෂ්ටතා සම්මාන උලෙළ (2019 සහ 2020) කොළඹදී පැවැත්වීම.

11. ෆේස්බුක් ඔස්සේ කළ අදහස් පළ කිරීමක් හේතුවෙන්, ජාතික රූපවාහිනියේ නිදහස් මාධ්‍යවේදිනි පාරමී නිලේප්ති සේවයෙන් ඉවත් කිරීම.

12. පොලිසියේ දූෂණ පිළිබඳව කළ වාර්තාකරණයක් හේතුවෙන් අරුණ පුවත්පතේ ප්‍රවෘති කර්තෘ චමින්ද සේනාරත්න තර්ජනයට ලක් වීම.

13. 2022 මාර්තු 31 වන දින මිරිහාන ප්‍රදේශයේ ඇති වූ මහජන විරෝධතාව වාර්තා කිරීමට ගිය මාධ්‍යවේදීන් පිරිසකට පහර දීම හා කැමරා උපකරණවලට හානි සිදු කිරීම.

**1 වගුව: වාර්තා වූ සමස්ත සිදුවීම් - 2022 මාර්තු**

| ආවරණය කර ඇති සංරචකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| ආරක්ෂාව සහ සුරක්ෂිතබව | 03 |
| නීතිමය කොන්දේසි | 03 |
| මාධ්‍යයේ ස්වාධීනත්වය | 02 |
| වෘත්තීයවේදීත්වය | 03 |
| ව්‍යුහාත්මක කොන්දේසි | 02 |
| **එකතුව** | **13** |

## ආරක්ෂාව සහ සුරක්ෂිතබව

**මාධ්‍යවේදීන්ට තම වෘත්තිය ශාරීරික සහ මානසික ඒකාග්‍රතාවකින් යුක්තව නිදහස් ලෙස කර ගෙන යෑමේ වාතාවරණයක් පැවතීම ජනමාධ්‍ය නිදහස පිළිබඳ මූලික කොන්දේසියකි. එමෙන්ම ජනමාධ්‍ය නිදහස හා අදහස් පළ කිරීමේ නිදහස ආරක්ෂා වීමට නම්, පුරවැසියන්ට අනිටු ප්‍රතිවිපාකවලට මුහුණදීමේ අවදානමකින් තොරව ජනමාධ්‍ය ඔස්සේ හෝ වෙනත් ආකාරවලින් නිදහසේ අදහස් පළ කළ හැකි වාතාවරණයක් පැවතිය යුතුය. සාමාකාමීව රැස්වීමේ, විරෝධය පළ කිරීමේ හා උද්ඝෝෂණවල නිරත වීමේ නිදහසද අදහස් පළ කිරීමේ නිදහසට අයත් වේ. මෙම මූලික නිදහස බරපතළ ලෙස උල්ලංඝනය වූ අවස්ථා 3ක් මාර්තු මාසයේදී වාර්තා විය.**

**2 වගුව: 2022 මාර්තු: මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව - සිදුවීම් 03**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| ප්‍රහාර | 02 |
| මානසික බලපෑම් | 01 |
| **එකතුව** | **03** |

1. **වව්නියාව පුතුකුලම් ප්‍රදේශයේ හදිසි අනතුරක් වාර්තා කිරීමට ගිය මාධ්‍යවේදී රාසයියා ජයශංකර්ට පහර දී ඔහුගේ කැමරාවට අලාභහානි කිරීම.**

   මාර්තු 06 වැනිදා පෙරවරු 10.00 ට පමණ මෙම රිය අනතුර සිදු වී ඇති අතර ඒ හේතුවෙන් පිය පුතු දෙපළක් මියගොස් තිබේ. කෝපයට පත් ජනතාව බස් රථයට පහර දී ඇත. මාධ්‍යවේදී ජයශංකර් මෙම සිදුවීම වාර්තා කරමින් සිටියදී කිසියම් පිරිසක් ඔහුට පහර දී කැමරාවට අලාභ හානි සිදු කර ඇත. මාධ්‍යවේදියා මේ පිළිබඳව පූවරසන්කුලම් පොලිසියට පැමිණිලි කර තිබේ (පැමිණිලි අංකය C.I.B. 216/60).

   මූලාශය: https://tamilwin.com

2. **පොලිසියේ දූෂණ පිළිබඳව කළ වාර්තාකරණයක් හේතුවෙන් අරුණ පුවත්පතේ ප්‍රවෘති කර්තෘ චමින්ද සේනාරත්න තර්ජනයට ලක් වීම.**

   'හිටි හැටියේ පොහොසත් වන පොලිස් ලොක්කෝ' යන සිරස්තලය යටතේ පොලිසියේ ඉහළ නිලධාරීන්ගේ දූෂණ පිළිබඳව මාර්තු 15 වැනිදා අරුණ පුවත්පතේ පළ කළ වාර්තාවක් හේතුවෙන් මාර්තු 18 වැනිදා දුරකථනය ඔස්සේ මෙම තර්ජනය එල්ල වී තිබේ. දේශීය දුරකථන අංකයක් හා ඉන්දියානු දුරකථන අංකයක් ඔස්සේ තමන්ට තර්ජනාත්මක ඇමතුම් ලැබුණු බව චමින්ද සේනාරත්න ප්‍රකාශ කරයි. මේ සම්බන්ධයෙන් ඔහු අංක CIB 3 272/143 යටතේ පොලිසියට පැමිණිලි කර ඇති අතර, ඒ පිළිබඳව කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පොලිස්පතිවරයාට ලිපියක් යොමු කරමින් ඉල්ලා සිටියේය.

   මූලාශ්‍ර: 1. FMM Media Rights Monitoring Desk

   2. https://www.sinhala.srilankamirror.com

3. 2022 මාර්තු 31 වන දින මිරිහාන ප්‍රදේශයේ ඇති වූ මහජන විරෝධතාව වාර්තා කිරීමට ගිය මාධ්‍යවේදීන් පිරිසකට පහර දීම හා කැමරා උපකරණවලට හානි සිදු කිරීම.

   මාර්තු 31 වැනිදා නුගේගොඩ මිරිහාන ප්‍රදේශයේ පිහිටි ජනාධිපතිවරයාගේ පෞද්ගලික නිවස අසල පැවති විරෝධතාව වාර්තා කිරීමට ගිය, ජනමාධ්‍යවේදීන් 07 දෙනෙකු ආරක්ෂක අංශවල ප්‍රහාරයට ලක් වූ අතර ඔවුන්ගේ කැමරා උපකරණවලට බරපතළ හානි සිදු කරන ලදි. ප්‍රහාරය හේතුවෙන් කිහිපදෙනෙකුට රෝහල්ගතව ප්‍රතිකාර ගැනීමට සිදු විය. එක් මාධ්‍යවේදියකු අත්අඩංගුවට ගනු ලැබීය. ජනමාධ්‍යවේදීන් ලෙස තම අනන්‍යතාව තහවුරු කළ පසුවත් ප්‍රහාර එල්ල කළ බව එම ජනමාධ්‍යවේදීහු ප්‍රකාශ කරති. සුමේධ සංජීව ගාල්ලගේ, අවංක කුමාර, නිස්සංක වෙරපිටිය, ප්‍රදීප් වික්‍රමසිංහ, ළහිරු චාමර, චතුර දේශාන්, සුලෝචන ගමගේ යන මාධ්‍යවේදීන් මෙලෙස ප්‍රහාරයට ලක්ව ඇති අතර, සංජීව ගාල්ලගේ අත්අඩංගුවට පත් විය. මීට අමතරව සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයන් හා උද්ඝෝෂණයේදී විවෘතව අදහස් පළ කළ පිරිසක්ද පහරකෑමට ලක්ව හා අත්අඩංගුවට පත්ව ඇත.

   අත්අඩංගුවට ගත් 54 දෙනෙකු රිමාන්ඩ් භාරයට පත් කරන ලෙස පොලිසිය ඉල්ලා සිටි නමුත් එය ප්‍රතික්ෂේප කළ අධිකරණය, ඔවුන්ගෙන් 48 දෙනෙකුට ඇප නියම කළේය. 6 දෙනෙකු හඳුනාගැනීමේ පෙරෙට්ටුවකට ඉදිරිපත් කිරීමට නියෝග කෙරිණි. සැකකරුවන් වෙනුවෙන් නීතිඥවරුන් විශාල පිරිසක් ස්වේච්ඡාවෙන් පෙනී සිටීම විශේෂ සිදුවීමකි.

   නිදහස් මාධ්‍ය ව්‍යාපාරය මෙම ප්‍රහාරය හෙළාදකිමින් නිවේදනයක් නිකුත් කළ අතර පොලිස්පතිවරයාට ලිපියක්ද යොමු කළේය. ශ්‍රී ලංකා තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය, මේ පිළිබඳව මානව හිමිකම් කොමිසම වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කළේය.

   මූලාශ්‍ර: 1. FMM Media Rights Monitoring Desk

   2. https://mawbima.lk

## නීතිමය කොන්දේසි

**මාධ්‍ය නිදහසට අදාළව නීතිමය කොන්දේසි පිළිබඳ සංරචකය යටතට ගැනෙන සිදුවීම් 3ක් මාර්තු මාසය තුළ නිරීක්ෂණය විය. මාධ්‍ය නිදහස ඇතුළුව අදහස් පළ කිරීමේ නිදහසට දැඩි බලපෑමක් ඇති කරන පනත් දෙකක් පාර්ලිමේන්තුව මගින් සම්මත කිරීම ඒ අතරින් සුවිශේෂ වෙයි.**

**3 වගුව: 2022 මාර්තු : නීතිමය කොන්දේසි - සිදුවීම් 03**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| නීතිමය ක්‍රියාමාර්ග | 01 |
| නීති ප්‍රතිසංස්කරණ /තොරතුරු දැනගැනීමේ අයිතිය | 02 |
| **එකතුව** | **03** |

1. **ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වසරකුත් මාස 4ක කාලයක් රඳවා තබාගෙන සිටි මඩකලපුවේ මාධ්‍යවේදී කෝකිලදාසන් ඇප මත මුදාහැරීම.**

   සිය ෆේස්බුක් ගිණුමේ පළ කළ ඡායාරූප හා අදහස් හේතුවෙන්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා තබාගෙන සිටි ඔහු මාර්තු 07 වැනිදා නීතිපතිවරයාගේ උපදෙස් පරිදි ඇප මත මුදාහැරිණි. 2020-11-28 වැනිදා වාලච්චේන පොලිසිය මගින් ඔහු අත්අඩංගුවට ගැනුණු අතර රැඳවුම් නියෝගයක් මත රඳවා තබා ගැනීමෙන් අනතුරුව රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි. කෝකිලදාසන් අත්අඩංගුවට ගැනීම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අදහස් ප්‍රකාශනයේ අයිතියට එරෙහිව අවභාවිත කිරීමක් ලෙස ජාතික හා ජාතන්තර මානව හිමිකම් ආරක්ෂකයින්ගේ විරෝධයට ලක් විය.

   මූලාශ්‍රය: https://economynext.com

2. **ජනමාධ්‍ය නිදහසට තර්ජනයක් වන විධිවිධාන ඇතුළත් පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත පාර්ලිමේන්තුවේදී සම්මත වීම.**

   ජනමාධ්‍ය නිදහසටත්, තොරතුරු දැනගැනීමේ අයිතියටත් හානිකර වීම හේතුවෙන් මාධ්‍ය ප්‍රජාවගේ විරෝධයට හේතු වූ 'පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත' මාර්තු 09 වැනිදා පාර්ලිමේන්තුවේදී සම්මත කෙරිණි. ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය සමග මාධ්‍ය සංවිධාන 7ක් සහ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය අදාළ පනතතෙන් ජනමාධ්‍ය නිදහසට තර්ජනයක් වන අයුරු පෙන්වා දී අවශ්‍ය සංශෝධන යෝජනා කළ නමුත් පනත සංශෝධනවලින් තොරව සම්මත විය.

   ශ්‍රී ලංකා තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය මෙම පනතට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කිරීමට කටයුතු කළ නමුත් තාක්ෂණික හේතු මත එය ප්‍රතික්ෂේප විය.

   මූලාශ්‍ර: 1. https://ceylontoday.lk
   2. https://sinhala.lankanewsweb.net

3. **මානව හිමිකම් ආරක්ෂකයින්ගේ දැඩි විරෝධයට හේතු වූ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන සංශෝධන) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේදී සම්මත වීම.**

   ත්‍රස්තවාදය වැළැක්වීමේ තාවකාලික විධිවිධාන සංශෝධන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේදී වැඩි ඡන්ද 51කින් සම්මත විය. පනතට පක්ෂව ඡන්ද 86ක් හිමි වූ අතර විරුද්ධව ඡන්ද 35ක් ලැබුණි. ආණ්ඩුව මෙම සංශෝධනය ඉදිරිපත් කළේ මානව හිමිකම්වලට එරෙහි බිහිසුණු නීතියක් වන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කළ යුතු බවට මානව හිමිකම් ආරක්ෂකයින් කලක පටන් කරමින් සිටින බලපෑමට ප්‍රතිචාර වශයෙනි. එහෙත් එම සංශෝධනය මගින් ප්‍රමාණවත් වෙනසක් සිදු වී නොමැති බව පනතට විරෝධය පළ කරන්නන්ගේ අදහසයි. පනත මුළුමනින්ම අහෝසි කළ යුතු බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේද ස්ථාවරය වී තිබේ.

   මූලාශ්‍රය: 1. https://sinhala.slbcnews.lk
   2. https://sinhala.lankanewsweb.net

## මාධ්‍යයේ ස්වාධීනත්වය

**මාධ්‍යයේ ස්වාධීනත්වය යන සංරචකයට, මාධ්‍ය ආයතනයක් තුළ මාධ්‍යවේදීන්ගේ ස්වාධීනත්වය, විදෙස් මාධ්‍යවල කර්තෘමණ්ඩල ස්වාධීනත්වය, දේශපාලනඥයින්ගේ පීඩනයෙන්, ව්‍යාපාරික බලවතුන්ගේ බලපෑමෙන් හා ආගමික බලපෑම්වලින් මාධ්‍යයේ ස්වාධීනත්වය, වෙළෙඳ දැන්වීම් ලබා දීමෙන් හෝ නොදීමෙන් අන්තර්ගතයට බලපෑම් කිරීම යන දර්ශක අයත් වේ. ඒ අනුව, එයින් දර්ශක කිහිපයක් ආවරණය වන සිදුවීම් දෙකක් මාර්තු මාසයේදී නිරීක්ෂණය විය.**

**4 වගුව: 2022 මාර්තු: මාධ්‍යයේ ස්වාධීනත්වය - සිදුවීම් 02**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| මාධ්‍ය ආයතනයක් තුළ මාධ්‍යවේදීන්ගේ ස්වාධීනත්වය | 01 |
| දේශපාලන බලවතුන්ගේ/හිමිකරුවන්ගේ බලපෑම්වලින් ස්වාධීනත්වය | 01 |
| **එකතුව** | **02** |

1. **මාධ්‍යවේදී රාහුල් සමන්ත හෙට්ටිආරච්චිගේ වාර්තාකරණයක් සම්බන්ධයෙන් හිරු නාලිකාවේ හිමිකරුගේ සොහොයුරා වන දුමින්ද සිල්වා බලපෑම් කිරීම.**

   අම්බලන්තොට ප්‍රදේශයේ සිදු වන අනවසර වැලි ජාවාරමක් පිළිබඳව රූගත කළ දර්ශන මාධ්‍ය මගින් ප්‍රචාරය නොකරන ලෙස, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති හා හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී දුමින්ද සිල්වා දුරකථනය ඔස්සේ තමන්ට බලපෑම් කළ බව රාහුල් සමන්ත හෙට්ටිආරච්චි ප්‍රකාශ කරයි. 'හිරු නාලිකාවේ හිමිකරු රේනෝ සිල්වාගේ සහෝදරයා' වශයෙන් දුමින්ද සිල්වා තමන් හඳුන්වා දෙන අයුරු, රාහුල් විසින් පටිගත කරන ලද එම දුරකථන සංවාදයෙහි පැහැදිලිව දැක්වේ. නිදහස් මාධ්‍යවේදියකු වන රාහුල් හිරු නාලිකාව වෙතද ප්‍රවෘත්ති ලබා දෙන අතර, මෙය හිමිකාරත්වයේ බලය උපයෝගී කරගෙන මාධ්‍යකරණයට බලපෑම් එල්ල කිරීමක් ලෙස සැලකිය හැකිය. මරණ දඬුවම නියම වී සිටි දුමින්ද සිල්වා, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා විසින් පිරිනමන ලද සමාවක් මත නිදහස ලැබූ අතර, පසුව ඔහු ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපතිධුරයට පත් කෙරිණි. මෙම පසුබිම මත අදාළ බලපෑම සුළු කොට නොතැකිය යුතු බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය නිවේදනයක් නිකුත් කරමින් ප්‍රකාශ කළේය.

   මූලාශ්‍රය: FMM Media Rights Monitoring Desk

2. **ෆේස්බුක් ඔස්සේ කළ අදහස් පළ කිරීමක් හේතුවෙන්, ජාතික රූපවාහිනියේ නිදහස් මාධ්‍යවේදිනි පාරමී නිලේප්තිගේ සේවයෙන් ඉවත් කිරීම.**

   සිය ෆේස්බුක් ගිණුම ඔස්සේ රජය හා ජනාධිපතිවරයා පිළිබඳ විවේචනාත්මක අදහස් පළ කළේය යන චෝදනාව මත, වැඩසටහන් පූරකවරියක ලෙස ඇයගේ සේවය තවදුරටත් ලබා නොගන්නා ලෙස පාලනාධිකාරිය උපදෙස් දී ඇතැයි නිෂ්පාදකවරුන් පැවසූ බව පාරමී නිලේප්ති සඳහන් කරයි. මේ සම්බන්ධයෙන් නිවේදනයක් නිකුත් කරන නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, රාජ්‍ය මාධ්‍යයක සේවය කරන මාධ්‍යවේදීන්ටද ව්‍යවස්ථාපිත පුරවැසි අයිතීන් හිමි බව අවධාරණය කළේය. එමෙන්ම මෙය, මාධ්‍යවේදීන් ආවේක්ෂණයට ලක් කිරීම පිළිබඳව මෑත කාලයේදී නැඟුණු චෝදනා සනාථ කරන අවස්ථාවක් ලෙසද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය නිරීක්ෂණය කරයි.

   මූලාශ්‍රය: FMM Media Rights Monitoring Desk

## වෘත්තීයවේදීත්වය

**වෘත්තීයවේදීත්වය යන සංරචකය යටතට, මාධ්‍යවේදීන්ට හොඳ අධ්‍යාපනයක් තිබීම, මාධ්‍යවේදීන්ගේ සේවා කොන්දේසි, මාධ්‍යවේදීන් කර්තෘමණ්ඩල හා ජාත්‍යන්තර මාර්ගෝපදේශ භාවිතය, ස්වයං වාරණය, වෘත්තීය සමිති හා සංගම් මගින් මාධ්‍යවේදියාගේ ස්වාධිපත්‍යය, තමන්ගේ කාර්යභාරය පිළිබඳව මාධ්‍යවේදියාගේ අවබෝධය, මාධ්‍ය වෘත්තියට ඇති පිළිග ැනීම යන දර්ශක ඇතුළත් වේ. එම දර්ශක නියෝජනය කරන අවස්ථා දෙකක් මාර්තු මාසයට අදාළව නිරීක්ෂණය විය.**

**5 වගුව: 2022 මාර්තු: වෘත්තීයවේදීත්වය - සිදුවීම් 02**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| මාධ්‍යවේදීන් කර්තෘමණ්ඩල හා ජාත්‍යන්තර මාර්ගෝපදේශ භාවිතය | 01 |
| මාධ්‍ය වෘත්තියට ඇති පිළිගැනීම | 01 |
| **එකතුව** | **02** |

1. **ශ්‍රී ලංකාවේ ඉන්ටනෙට් පරිශීලකයන්ගේ සුරක්ෂිතබව හා ස්වයං නියාමනය ශක්තිමත් කිරීම අරමුණු කරගත් SafeWebLK වැඩසටහන කොළඹදී ආරම්භ කිරීම.**

   ශ්‍රී ලංකාවේ ඉන්ටනෙට් පරිශීලකයන්ට වඩාත් සුරක්ෂිත ඉන්ටනෙට් සේවා ලබා දීමට ගෝලීය ඉන්ටනෙට් සමාගම් සමඟ සාමූහික එකඟත්වයක් ඇති කර ගැනීම, දුස්තොරතුරු සහ වෛරී ප්‍රකාශ සමාජමාධ්‍ය ඔස්සේ පැතිර යෑම හැකි තාක් අවම කිරීමට, සයිබර් හිංසන අවම කිරීම හා දැනට ක්‍රියාත්මක ස්වයං නියාමන රැකවරණ වඩාත් තියුණු කිරීමට SafeWebLK වැඩසටහනේ අරමුණයි. මෙය ආසියාවේ රටක මෙවැනි ස්වයං නියාමන චර්යා පද්ධතියක් ප්‍රවර්ධනය කරනු ලබන ප්‍රථම අවස්ථාව වන අතර ජාත්‍යන්තර සබඳතා පිළිබඳව කටයුතු කරන පර්යේෂණ සමාගමක් වන Factum ආයතනය මේ සඳහා නායකත්වය සපයයි. මාර්තු 16 වැනිදා පැවති සමාරම්භක අවස්ථාවට අලි ෂබ්රි සහ ඩලස් අලහප්පෙරුම යන (හිටපු) ඇමතිවරුද සහභාගී වූහ.

   මූලාශ්‍රය: http://srilankanews.lk

2. **ශ්‍රී ලංකා කර්තෘ සංසදය සහ ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය සංවිධානය කළ පුවත්පත් විශිෂ්ටතා සම්මාන උලෙළ කොළඹදී පැවැත්වීම**

   'පුවත්පත් විශිෂ්ටතා සම්මාන උලෙළ 2019 සහ 2020' මාර්තු 22 වැනිදා කොළඹ හිල්ටන් හෝටලයේදී පැවැත්විණි.

   සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍ය තුනෙන් සම්මාන ඉසව් 18ක් වෙනුවෙන් මෙම සම්මාන පිරිනැමේ. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ජනමාධ්‍ය සම්මාන උලෙළ මෙය වන අතර මෙවර පැවැත්වූයේ 22 වැනි උලෙළයි.

## වයුහාත්මක කොන්දේසි

**'වයුහාත්මක කොන්දේසි' යන්න මාධ්‍ය නිදහස පිළිබඳව සලකා බැලෙන වැදගත් සංරචකයකි. මාධ්‍ය පද්ධතියේ සමස්ත වයුහයට මෙන්ම මාධ්‍ය නිදහස සක්‍රිය කරන සමස්ත පරිසරයට අදාළ වන විභව දර්ශක 6ක් මෙම මානයට ඇතුළත්ය. ඒ අතරින් 'අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය' යන දර්ශකයට අයත් වන අවස්ථා 3ක් මාර්තු මාසයේදී නිරීක්ෂණය විය.**

**6 වගුව: 2022 මාර්තු: වයුහාත්මක කොන්දේසි - සිදුවීම් 03**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය | 03 |
| **එකතුව** | **03** |

1. **හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී රන්ජන් රාමනායකගේ නිදහස උදෙසා සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරුන් ජිනීවා මානව හිමිකම් කොමිසම හමුවේ කරුණු දැක්වීම.**

   අධිකරණයට අපහාස කිරීමේ චෝදනාව වෙනුවෙන් සිර දඬුවම් නියම වූ රංජන් රාමනායක හිටපු මන්ත්‍රීවරයා නිදහස් කර ගැනීම උදෙසා සමගි ජනබලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන හරීන් ප්‍රනාන්දු හා මනුෂ නානායක්කාර මාර්තු 02 වැනිදා ජිනීවා ජිනීවා මානව හිමිකම් කොමිසම හමුවේ කරුණු දැක්වූහ.

   විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුව සිටියදී ඉහත චෝදනාවට රන්ජන් වරදකරු වූ අතර වසර 4ක සිරදඬුවම් සහ වසර 7 කට ඔහුගේ සිවිල් අයිතිවාසිකම් අත්හිටුවීමට නියම කෙරිණි. ප්‍රශ්නගත අධිකරණ තීන්දුවක් මගින් සිරගත කළ රංජන් රාමනායක නිදහස් කරන ලෙස ජිනීවා නුවර මූලස්ථානය කොට ගත් 'අන්තර් පාර්ලිමේන්තු සංගමය' පසුගිය දෙසැම්බර් මාසයේදී ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටියේය.

   මූලාශ්‍රය: [https://www.news19.lk](https://www.news19.lk)

2. **පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතෙන් තොරතුරු පනතට සහ භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහසට ඇති බලපෑම ගැන මහජන කතිකාවක් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සංවිධායකත්වයෙන් පැවැත්වීම.**

   පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතෙන් තොරතුරු පනතට සහ භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහසට ඇති බලපෑම ගැන දැනුවත් කිරීමේ සහ ඉදිරි ක්‍රියාමාර්ග ගැන සාකච්ඡා කිරීමේ අරමුණින් මාර්තු 11 වැනිදා සවස 02.00 සිට 04.00 දක්වා කොළඹ, ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී මෙම සංවාදය පැවැත්විණි. නීතිඥ නුවන් බෝපගේ මෙහි ප්‍රධාන අදහස් දැක්වීම සිදු කළ අතර, නීතිඥ ප්‍රබෝධ රත්නායක, නීතිඥ පියුම් මධුෂානි සහ ජනමාධ්‍ය සංවිධානවල නියෝජිතයෝද අදහස් පළ කළහ.

   මූලාශ්‍රය: FMM Media Rights Monitoring Desk

3. **'ජනමාධ්‍යකරණය තුළ හිංසන පිටුදකිමු' යන්න තේමා කොටගත් සංවාදයක් 'මීඩියා සැලෝන්' වැඩසටහනේ සංවිධායකත්වයෙන් පැවැත්වීම**

   #MeToo ව්‍යාපාරයේ සන්දර්භය තුළදී, ප්‍රවෘත්ති කාමර තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවී හිංසනය පිළිබඳ සංවාදයක් ගොඩනැගීම මෙම සැසියේ අරමුණයි.

   මාධ්‍ය නිදහස සහ භාෂණයේ නිදහසට එල්ල වන තර්ජන පිළිබඳව නව තොරතුරු හුවමාරු කරගැනීම, ඒ පිළිබඳව ගත හැකි ක්‍රියාමාර්ග සාකච්ඡා කිරීම, නිදහස් කථනයට ඇති තර්ජන හඳුනාගැනීම සඳහා ජනමාධ්‍යවේදීන්ට ආරක්ෂිත අවකාශයක් සලසාදීමේ අරමුණින් හෑෂ්ටැග් පරපුර (Hashtag Generation), USAID (අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඇමෙරිකා එක්සත් ජනපද ආයතනය) අනුග්‍රාහකත්වය දක්වන IREX (ජාත්‍යන්තර පර්යේෂණ සහ හුවමාරු මණ්ඩලය) ආයතනය විසින් ක්‍රියාත්මක කරන ප්‍රජාතන්ත්‍රවාදී ශ්‍රී ලංකාවක් වෙනුවෙන් මාධ්‍ය සවිබල ගැන්වීමේ වැඩසටහන (MEND) සමඟ හවුල්කාරීත්වයක්, මීඩියා සැලෝන් නමින් ඇති කරගෙන තිබේ.

**7 වගුව: මාධ්‍ය නිදහස: 2022 ජනවාරි - මාර්තු දක්වා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙත වාර්තා වී ඇති සිදුවීම්.**

| ආවරණය කර ඇති සංරචකය | 2022 ජනවාරි - පෙබරවාරි | | 2022 මාර්තු |
|---|---|---|---|
| | නව සිදුවීම් | පෙර සිදුවීම්වල වර්ධනයන් | |
| ආරක්ෂාව හා සුරක්ෂිතබව | 09 | | 03 |
| නීතිමය කොන්දේසි | 12 | | 03 |
| මාධ්‍යයේ ස්වාධීත්වය | | | 02 |
| වෘත්තීයවේදීත්වය | | | 02 |
| ව්‍යුහාත්මක කොන්දේසි | 09 | | 03 |
| **එකතුව** | **30** | | **13** |

[2022 මාධ්‍ය නිදහස මාසික වාර්තාව ජනවාරි-පෙබරවාරි මෙතැනින් බලන්න]

**පසුසටහන:** සිවිල් සමාජ අපේක්ෂාවන්, ජාතික හා ජාත්‍යන්තර නඩු තීන්දු සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්ටද අනුව යමින්, මාධ්‍ය නිදහස යනු මානව අයිතියක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. සෑම තැනැත්තකුම සතු  සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස මෙන්ම අන් තැනැත්තන්ගේ මත දැනගැනීමට තිබෙන මූලික අයිතිය බාධාවකින් තොරව භුක්තිවිඳීම මානව අයිතියකි. මෙම පදනම මත පිහිටා මාධ්‍ය නිදහස යනු පහත දැක්වෙන දසවැදෑරුම් සංඝටකවල එකතුවක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සලකයි. (1) සිතීමේ නිදහස (2) මතයක් දැරීමේ නිදහස (3) භාෂණයේ නිදහස (4) සාමකාමීව රැස්වීමේ නිදහස ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස (5) තොරතුරු දැනගැනීමේ නිදහස (6) ශ්‍රව්‍ය, දෘශ්‍ය පටිගත කිරීමේ සහ වාර්තා තබා ගැනීමේ නිදහස (7) ප්‍රකාශනයේ නිදහස (8) පුවත්පත් නිදහස (9) විද්‍යුත් මාධ්‍ය නිදහස (10) අන්තර්ජාල නිදහස යනු එම සංඝටකයන්ය. මෙම සංඝටක අතර ඇත්තේ සහජීවී සම්බන්ධයක් වන අතර එක් සංඝටකයක ඇති වන සීමාවක් මාධ්‍ය නිදහස පිළිබඳ අනෙක් සියලුම සංඝටකයන් භුක්තිවිඳීමේ නිදහස අහුරන බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. එමෙන්ම වගකීම් විරහිතව හා වෛරී සහගත ලෙස එම නිදහස භාවිත කිරීම යහපත් භාවිතාවක් නොවන බවද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කරයි.

මෙම  මාසික වාර්තා පිළියෙල කරනු ලබන්නේ ජනමාධ්‍ය වාර්තා සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට ලබා ගත හැකි තොරතුරු අනුව වැඩිදුර තොරතුරු සොයා එම සිදුවීම් විශ්ලේෂණය කිරීමෙනි. මෙම විශ්ලේෂණයේදී නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඉහත කී දසවැදෑරුම් මාධ්‍ය නිදහස් සංඝටකයන් ආවරණය කරන ජාත්‍යන්තරව පිළිගත් සංරචකයන් හතක් ඔස්සේ තෝරා ගත් නිර්ණායක භාවිත කරයි.

Free Media Movement
Convener: Lasantha De Silva  +94 71 166 7938, +94 77 810 7620 | Secretary: Hana Ibrahim +94 77 741 2995
Treasurer:  Ananda Jayasekara +94 77 312 4850
No 96, Bernard Soysa Mw, Colombo 05.  Tel: +94 112368895 Fax: +94 112368895;
Web: www.fmmsrilanka.lk, www.mediareform.lk
Email: fmmsrilanka@gmail.com|Facebook: https://www.facebook.com/fmm.srilanka
Twitter: https://twitter.com/FMMsrilanka|#FMM25